චක්‍ර ලේඛ අංකය : 1995/06

මගේ අංකය : මාදු/1/2/90 (මත්ද්‍රව්‍ය)
මත්ද්‍රව්‍ය නිවාරණ අධ්‍යාපන ව්‍යාපෘතිය,
මාර්ගෝපදේශක හා උපදේශක ශාඛාව,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය - බත්තරමුල්ල.
1995. 01. 31 දින

සියලුම පාසල් ප්‍රධානීන් වෙත.

## පාසල් තුළ දුම්පානය හා සුරාපානය තහනම් කිරීම

පාසල් තුළ දුම්බීම යනුවෙන් එවන ලද මගේ අංක 2/ පාස/7/ 27, 86. 04. 11 හා මාදු/1/2/90 92. 10. 16 වන දින දරණ චක්‍රලේඛන හා බැඳේ.

පාසල් තුළින් දුම්පානය හා සුරාපානය තුරන් කිරීමට එම චක්‍රලේඛය ප්‍රමාණවත් නොවන බව පෙනී ගොස ඇත. එබැවින්, පහත සඳහන් විධි විධාන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

1 ගුරුවරුන් හා විදුහලේ වෙනත් සේවකයින් හෝ පාසැලට එන දෙමාපිය වැඩිහිටි ආදීන් හෝ පාසල් භූමිය තුළ දී දුම්පානය හෝ සුරාපානය කිරීම සපුරා තහනම් කළ යුතු ය.

2 දුම්වැටි හෝ මත්පැන් හෝ පාසල් දරුවන් ලවා ගෙන්වා ගැනීම සම්පූර්ණයෙන් තහනම් කළ යුතු ය.

3 පාසල් ආපනශාලාව තුළ හෝ භූමිය තුළ දුම්වැටි හෝ මත්පැන් අලෙවිය මුළුමනින් ම තහනම් කළ යුතුය.

4 පාසල් භූමිය තුළත් පාසල් උත්සව අවස්ථාවන්හි දී දුම්පානය හෝ සුරාව සම්පූර්ණයෙන් ම තහනම් කළ යුතු ය.

5 පාසල් භූමිය තුළ දුම්පානය හා මත්පැන් පානය තහනම් කරමින් දන්වීම් පාඨ දන්වීම පුවරුවල සවිකර තැබිය යුතු ය.

6 පාසල් තුළ හෝ පාසල් භූමිය තුළ ශිෂ්‍යයන් හෝ ගුරුවරුන් හෝ සේවකයන් හෝ වැඩිහිටි දෙමාපිය ආදීන් හෝ වෙනත් බාහිර කවර පුද්ගලයකු හෝ මත්පැන්, මත්ද්‍රව්‍ය ගත් බව සැලවුවහොත් ඒ ගැන දැඩි ලෙස ක්‍රියා කළ යුතු ය.

කරුණාකර මෙම චක්‍ර ලේඛයෙහි අඩංගු කරුණු ගුරු මණ්ඩලයට හා අනෙකුත් සේවකයින්ට දැඩි ලෙස අවධාරණය කරවන්න. දුම්බීම/සුරාව/විෂ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ආදීන ව පිළිබඳ ව සිසුන් ගුරු දෙගුරුන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කරන්නේ නම් මැනවි.

එම්. ඩී. ඩී. පීරිස්
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1 පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
2 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
3 කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
4 ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දුම්බීම හා සෞඛ්‍ය පිළිබඳ ජාතික කමිටුව
5 සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රාජගිරිය